## ශ්‍රී ලංකා වරාය අධිකාරිය
### තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. <u>තනතුර : සහකාර නාවික හා භාරන යාත්‍රාපති (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම) - JLM</u>**

**(අ) යෝග්‍යතාවය**

දළ බර ටොන් 500 කට අඩු වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල යාත්‍රාපතිවරයෙකු ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක්

**හෝ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ වෙනත් උසස් මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

**පළපුරුද්ද :**

නාවික නිලධාරියෙකු (Navigational Watch Keeping Officer) වශයෙන් වසර දෙක (02) ක මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම

**(ආ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 5 : 0 (JLM ) |
| මූලික වැටුප | : | රු. 75,065/= |
| වැටුප් වර්ධකය | : | රු. 1,440/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 170,000/= පමණ වේ

**02. <u>තනතුර : උප වරාය යාත්‍රාපති (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම) - JLM</u>**

**(අ) යෝග්‍යතාවය**

දළ බර ටොන් 500 කට අඩු වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල යාත්‍රාපතිවරයෙකු ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල රාජ්‍යයක සමුද්‍රීය පරිපාලනයක් විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක්

**හෝ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද හෝ පිළිගනු ලැබූ හෝ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල රාජ්‍යයක සමුද්‍රීය පරිපාලනයක් විසින් නිකුත් කරන ලද වෙනත් ඕනෑම ඉහල මට්ටමේ නිපුණතා සහතිකයක්.

**සමඟ**

**පළපුරුද්ද :**

නාවික නිලධාරියෙකු (Navigational Watch Keeping Officer) වශයෙන් වසර දෙක (02) ක මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම

02 පිටුවට.......

**(ආ) වැටුප**

වැටුප් කාණ්ඩය : 5 : 0 (JLM )
මූලික වැටුප : රු. 75,065/=
වැටුප් වර්ධකය : රු. 1,440/=

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 170,000/= පමණ වේ

**වයස් සීමාව : වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක සහ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් කොට්ඨාශය - විධායක අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-07-14 වන දිනට පෙර **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**